8

බුද්ධශාසන අමාත්‍යාංශය
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
ශ්‍රී බු. ව. 2562 - දහම් පාසල් ශ්‍රේණි විභාගය
2018 නොවැම්බර් 25

023338

6 ශ්‍රේණිය

විභාග අංකය :

කාලය පැය 01 යි.

(i) කොටසේ ප්‍රශ්න සියල්ලටත් (ii) කොටසින් තෝරාගත් ප්‍රශ්න අටකටත් (08) පමණක් පිළිතුරු සපයන්න.
(i) කොටසට ලකුණු (2 ×10) 20කි. (ii) කොටස සඳහා ලකුණු (10×08) 80කි.

## I කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. බුද්ධ රත්නය හා ධර්ම රත්නය සරණ ගිය පළමු උපාසකයෝ කවරහු ද?
   (i) යසකුල පුත්‍ර සහ පියතුමා ය. (ii) තපස්සු භල්ලුක වෙළෙඳ දෙබෑයෝ ය.
   (iii) තුන්බෑ ජටිලයෝ ය. (iv) උපතිස්ස කෝලිත දෙදෙනා ය.

02. "මම සම්මා සම්බුද්ධ වෙමි. නිවුණු සැනසුණු කෙනෙක්මි. දම්සක් පැවැත්වීමට කසී පුරයට යමි".
   බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ මෙසේ හඳුන්වා දුන්නේ කාට ද?
   (i) උපක නම් ආජීවකයාට ය. (ii) සුජාතා සිටු දියණියට ය.
   (iii) බක බ්‍රාහ්මණයාට ය. (iv) සංජය බෙල්ලට්ඨිපුත්තට ය.

03. පඤ්චසතිකා සංගීතිය නමින් හැඳින්වෙන්නේ . . .
   (i) දෙවන ධර්ම සංගායනාව යි. (ii) ප්‍රථම ධර්ම සංගායනාව යි.
   (iii) තෙවන ධර්ම සංගායනාව යි. (iv) සිව්වන ධර්ම සංගායනාව යි.

04. දෙවන ධර්ම සංගායනාව සඳහා හේතු වූ ප්‍රධාන කරුණ වන්නේ . . .
   (i) සුභද්‍ර හිමිගේ ප්‍රකාශය යි. (ii) වජ්ජිපුත්තක භික්ෂූන්ගේ දස අකැප වස්තුව යි.
   (iii) ශාසනය ඇරඹී කල්ගතවීම යි. (iv) භික්ෂූන් අතර බහුශ්‍රැත බව වැඩිවීම යි.

05. පව් කිරීමට බිය වීම හා පව් කිරීමට ලජ්ජා වීම උසස් ගුණයන් බව පෙන්නුම් කරන ජාතක කතාව කුමක් ද?
   (i) මඛාදේව ජාතක ය. (ii) මහා කපි ජාතක ය.
   (iii) නලපාන ජාතක ය. (iv) දේවධර්ම ජාතක ය.

06. සිංහල ධම්මසංගණී කෘතිය රචනා කළ රජතුමා කවුරු ද ?
   (i) මහා විජයබාහු රජතුමා ය. (ii) මහා පරාක්‍රමබාහු රජතුමා ය.
   (iii) නිශ්ශංකමල්ල රජතුමා ය. (iv) පළමුවන මිහිඳු රජතුමා ය.

07. මහා පරාක්‍රමබාහු රජතුමා විසින් පොළොන්නරු කතිකාවත සකස් කරවූයේ කවර අරමුණින් ද?
   (i) තම දේශපාලන දර්ශනය ඉදිරිපත් කිරීම සඳහා ය. (ii) තම සේවාවන් ලියා තැබීම සඳහා ය.
   (iii) තුන් නිකායේ භික්ෂූන් සමගි කරවීම සඳහා ය. (iv) අණපනත් ක්‍රියාත්මක කරවීම සඳහා ය.

08. යමෙක් තමන්ට සැප කැමති වන්නේ නම්, ඔහු විසින් . . .
   (i) අනුන්ට බලපෑම් කළ යුතු ය. (ii) අනුන් යටත් කර ගත යුතු ය.
   (iii) අනුන්ට හිංසා නොකළ යුතු ය. (iv) හැකි තරම් මුදල් එකතු කළ යුතු ය.

e - LEARNING HJ NETWORK
BEST HELPER FOR YOUR ONLINE LEARNING

09. අලුත් අස්වැන්නෙන් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිදීම හඳුන්වන්නේ . . .
(i) කාර්තික මංගල්‍යය නමිනි. (ii) අලුත් සහල් මංගල්‍යය නමිනි.
(iii) නානුමුර මංගල්‍යය නමිනි. (iv) පරණ අවුරුදු මංගල්‍යය නමිනි.

10. උපාදානක්ඛන්ධ පහම දුක් සහිත යැයි ඉගැන්වෙන්නේ . . .
(i) දුක්ඛ සමුදය ආර්ය සත්‍යයේ ය. (ii) දුක්ඛ ආර්ය සත්‍යයේ ය.
(iii) දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යයේ ය. (iv) පටිච්ච සමුප්පාදයේ ය.

## (II) කොටස

**පහත සඳහන් ප්‍රශ්නවලින් ප්‍රශ්න 08කට පමණක් පිළිතුරු සපයන්න. (එක් පිළිතුරක් සඳහා ලකුණු 10 බැගින් හිමි වේ.)**

01. මියගිය ඥාතීන්ට පිං අනුමෝදන් කරන ගාථාව ලියන්න.
02. ඔබගේ ශාරීරික පිරිසිදුකම රැකගැනීම සඳහා කළ යුතු දේ ඇතුළත් කරුණු අටක් ලියන්න.
03. පිටත අපිරිසිදුකම හා ඇතුළත අපිරිසිදුකම යනු කුමක්දැයි හඳුන්වා, ඒවා අපේ ජීවිතයට බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.
04. බාහිර පරිසරයේ අපිරිසිදුකම නිසා අපට වැළඳිය හැකි රෝගී තත්ත්වයන් මොනවා ද?
05. විනෝදාස්වාදය ධාර්මිකව ලැබිය හැකි ආකාර පහක් නම් කරන්න.
06. ඔබගේ ගෙවත්තේ වගා කළ හැකි දේශීය ඖෂධ වර්ග දහයක් නම් කරන්න.
07. මල්, පලතුරු, ඔසු වගාවලින් අපට ලබා ගත හැකි ප්‍රයෝජන මොනවා ද?
08. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව කුමක් ද? එහි ඇතුළත් කරුණු මොනවා ද?
09. "දස්සන කාමෝ සීලවතං - සද්ධම්මං සෝතු මිච්ඡති
විනෙය්‍ය මච්ඡේරමලං - සවේ සද්ධෝති වුච්චති."
ඉහත සඳහන් ගාථාවෙන් කියැවෙන ශ්‍රද්ධාවන්තයාගේ ලක්ෂණ ලියා දක්වන්න.
10. විනයධර භික්ෂූන් වහන්සේලා අතර අග්‍රතනතුරට පත් උපාලි මහරහතන් වහන්සේ තමන්ට පැවරුණ වගකීම් මැනවින් ඉටුකළ අයුරු උදාහරණවලින් පැහැදිලි කරන්න.
11. යුගකාරක තෙරවරුන්ගෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ 5ක් ලියන්න.
12. හේතුව, කාලය, ස්ථානය, මූලිකත්වය, අනුග්‍රහය, සහභාගිත්වය හා ප්‍රතිඵල යන කරුණු සඳහන් කරමින් පළමු ධර්ම සංගායනාව ගැන කෙටි හැඳින්වීමක් කරන්න.
13. දෙමාපියන් තුළ සිල්වත්කම වැඩිදියුණු කරවීම සඳහා ඔබට කළ හැකි දේ මොනවා ද?
14. මෙත්තානිශංස සූත්‍රයේ දැක්වෙන පරිදි මෛත්‍රී භාවනාවෙන් ලැබෙන ප්‍රතිඵල 11කි. ඉන් පහක් ලියන්න.
15. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර මාහිමියන්ගේ අනතිමානී බව ප්‍රකට කෙරෙන අවස්ථා දෙකක් සඳහන් කරන්න.

e-LEARNING
HJ NETWORK
BEST HELPER FOR YOUR ONLINE LEARNING
WEB | YOUTUBE | OTHER SOCIAL MEDIA | BOOK PUBLISHER | PRESS

බුද්ධශාසන අමාත්‍යාංශය
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
ශ්‍රී බු. ව. 2562 - දහම් පාසල් ශ්‍රේණි විභාගය
2018 නොවැම්බර් 25
06 ශ්‍රේණිය

e - LEARNING HJ NETWORK

පිළිතුරු පත්‍රය

(i) කොටසේ ප්‍රශ්න සියල්ලටත් (ii) කොටසින් තෝරාගත් ප්‍රශ්න අටකට පමණක් පිළිතුරු සපයන්න.

(i) කොටසට ලකුණු (2 × 10) 20කි. (ii) කොටස සඳහා ලකුණු (10 × 08) 80කි.

මූලාශ්‍රය - 06 ශ්‍රේණිය පෙළ පොත

## i කොටස

01 නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

| ප්‍රශ්න අංකය | පිළිතුර | පිටු අංකය | ඡේදය/ගාථාව/පාඨය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | (ii) තපස්සු භල්ලුක වෙළෙඳ දෙබෑයෝ ය. | 27 | 02 ඡේ | 02 |
| 02 | (i) උපක නම් ආජීවකයාට ය. | 28 | 04 ඡේ | 02 |
| 03 | (ii) ප්‍රථම ධර්ම සංගායනාව යි. | 32 | 02 ඡේ | 02 |
| 04 | (ii) වජ්ජිපුත්තක භික්ෂූන්ගේ දස අකැප වස්තුව යි. | 35 | 04 ඡේ | 02 |
| 05 | (iv) දේවධර්ම ජාතකය. | 45 | 02 ඡේ | 02 |
| 06 | (i) මහා විජයබාහු රජතුමා ය. | 47 | 03 ඡේ | 02 |
| 07 | (iii) තුන් නිකායේ භික්ෂූන් සමගි කරවීම සඳහා ය. | 48 | 03 ඡේ | 02 |
| 08 | (iii) අනුන්ට හිංසා නොකළ යුතුය. | 53 | 04 ඡේ | 02 |
| 09 | (ii) අලුත් සහල් මංගල්‍යය නමිනි. | 66 | 01 ඡේ | 02 |
| 10 | (ii) දුක්ඛ ආර්ය සත්‍යයේ ය. | 73 | 05 ඡේ | 02 |

## ii කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුර | පිටු අංකය | ඡේදය/ගාථාව/පාඨය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | ඉදං වෝ (මේ) ඤාතීනං හෝතු සුඛිතා හොන්තු ඤාතයෝ. | 87 | 07 | 10 |
| 02 | දිනපතා ස්නානය. උදේ සවස දත් මැදීම. නිය කැපීම. හිස පීරීම. කෙස් කැපීම, පිරිසිදු ඇඳුම් ඇඳීම. පාවහන් පැළඳීම. නිවස/වැසිකිලි/කැසිකිලි හා අවට පරිසරය පිරිසිදුව තබාගැනීම. | 93 | 03 | 10 |
| 03 | පිටත අපිරිසිදුකම - බාහිර පරිසරය, බාහිර ශරීරය, නිවස, වැසිකිලි කැසිකිලි හා අවට පරිසරයෙහි අපිරිසිදු කම. එමගින් ශාරීරික රෝග ඇතිවේ. ඇතුළත අපිරිසිදුකම - සිතේ අපිරිසිදුකමයි. කෙලෙස් නිසා සිත අපිරිසිදු වේ. අපිරිසිදු සිත නිසා බාහිර පරිසරය පිරිසිදුව තබා ගැනීමට ද හැකියාවක් නැත. එමගින් ශාරීරික හා මානසික රෝග වැළඳෙයි. | 95 | 2-3 | 10 |

ශ්‍රී සෝභිත පිරිවෙන් සියවස් සමරු දහම් පාසල - නාවින්න

| | | | | |
|---|---|---|---|---|
| 04 | පාචනය, සෙංගමාලය, වෛරස් රෝග, ඩෙංගු, සෙම් රෝග, උණ ආදිය.. | | | 10 |
| 05 | කවි ගී ගැයීම, සංගීත වාදනය, නාට්‍ය බැලීම, කවි ලිවීම, ගීත ලිවීම, ස්වභාව සෞන්දර්යය රසවිඳීම, පොත් කියවීම, විනෝද, වන්දනා ගමන් යාම, පැල සිටුවීම, මල් වැවීම. | 101 | 01 | 10 |
| 06 | කෝමාරිකා, ගොටුකොළ, හාතවාරිය, අක්කපාන, කහ, ඉගුරු, දෙහි, අරත්ත, ඉරිවේරිය, බැවිල, පොල්පලා, කටුවැල්බටු, සඳුන්, රසකිඳ, කටුකරෝසන, පාවට්ටා, කොතමල්ලි, රණවරා ආදිය... | 104 | 01 | 10 |
| 07 | පිරිසිදු ආහාර ලෙස ප්‍රයෝජනයට ගැනීම. නිවසේ ආලින්දය මලින් සැරසීම. මල්, පලතුරු, ඔසු පින්කම්වලට දීම, ත්‍යාග කිරීම, මල් පැණි බොන, ඵල කන සතුන් දැක සතුටුවීම, ගිලනුන්ට දීම, මල්, පලතුරු, ඔසු වර්ග අන් අයට හඳුන්වා දීම, වඳවී යන මල්, ඖෂධ වර්ග ආරක්ෂා කර ගැනීම. | 104 | 03 | 10 |
| 08 | ධම්මචක්කප්පවත්තන සූත්‍රය.<br>කාමසුඛල්ලිකානුයෝගය හා අත්තකිලමථානුයෝගය යන අන්ත දෙකෙහි ඇති අයහපත් බව, මධ්‍යම ප්‍රතිපදාවේ අගය, චතුරාර්ය සත්‍යය. | 29 | 01 | 10 |
| 09 | සිල්වතුන් දැකීම කැමැත්ත, නිතර දහම් ඇසීමට කැමැත්ත, මසුරු නැතිව දන් දීමට ඇති කැමැත්ත, | 24 | 01 | 10 |
| 10 | වරක මව මැරූ අයෙක් ද තවත් වරෙක පියා මැරූ අයෙක් ද ලජ්ජාවෙන් හා සමාජ ගර්හාවෙන් මිදීමට සිතා පැවිදි වීමට උත්සාහ කළ විට ඔවුන් පිළිබඳ තොරතුරු සොයා බලා වැරදි කරුවන් බව නිගමනය කිරීම.. විනය නීතියක් පැනවීමටද එය උපකාරී වීම.<br>වරක්, ජීවත්වීමට පහසු මගක් යයි සිතා හොරෙන් සිවුරු ඇඳ පැවිදි වෙස් ගත් තරුණයකුගේ සැබෑ තත්වය හෙළි කොට දැක්වීම.<br>පැවිදි වූ කුමාර කාශ්‍යප මාතාවගේ දරුගැබ පැවිදි වීමට පෙර ඇතිවූවක් බවට විශාඛා උපාසිකාව ලවා නිගමනය කරවීම.<br>ප්‍රථම ධර්ම සංගායනාවේදී විනය සම්බන්ධ සියලු පැන විසඳීම. | 16-17 | | 10 |
| 11 | 1. කුඩා කල සිටම මැනවින් සිප් සතර හදාළ යුතු බව.<br>2. ඕනෑම අභියෝගයකට අභීතව මුහුණ දිය යුතු බව.<br>3. ශික්ෂාකාමීව විනයගරුකව ජීවිතය ගත කළ යුතු බව.<br>4. මැනවින් විමසා බලා තීරණය ගත යුතු බව.<br>5. ඉගෙනීමේ නිසි ඵල නෙළා ගත හැකි බව.<br>6. ගුණ නුවණින් යුක්තවීම වැදගත් බව.<br>7. අසරණයන්ට පිහිටවීම අවශ්‍ය බව.<br>8. තමා ඉගෙන ගත් දෑ අනෙක් අයට බෙදාදිය යුතු බව.<br>9. ශාසනයේ ආරක්ෂාවට අපට කළ හැකි දේ කළ යුතු බව. | 82 | 02 | 10 |
| 12 | හේතුව - ධර්ම විනය පිරිහීමට පත්වෙමින් පැවතීම, සුභද්‍ර භික්ෂුව වැන්නවුන්ගේ මත ඉස්මතුවීම.<br>කාලය - මාස හතකි.<br>ස්ථානය - රජගහනුවර,වේභාර පර්වත පාමුල, සප්තපර්ණි ගුහාව අභියස දී<br>මූලිකත්වය - මහා කාශ්‍යප මහරහතන් වහන්සේ<br>අනුග්‍රහය - අජාසත් රජතුමා<br>සහභාගි වූ ප්‍රමාණය - රහතන් වහන්සේලා 500 නමක්<br>ප්‍රතිඵල - විසිරී පැවති ධර්ම විනය ඒකරාශි කර ධර්මය හා විනය ප්‍රධාන කරගත් බුද්ධ දේශනාවේ ආරක්ෂාව සහ චිර පැවැත්ම සඳහා පියවර ගැනීම. කොටස් වශයෙන් ආචාර්ය පරම්පරා වෙත පැවරීම. | 31-33 | | 10 |
| 13 | පස්පව්වල ආදීනව කියැවෙන බණ කතා, පුවත්පත් වාර්තා, පද්‍ය රචනා ඇසීමට සැලැස්වීම. උපෝසථ සීලය සමාදන්වීමට උනන්දු කරවීම. සිල් සමාදන් වූ දෙගුරුන්ට උවටැන් කිරීම. මතට ලොල් වූ පියවරුන්ට කරුණාවෙන් එහි ආදීනව පැහැදිලි කර දී ඉන් මුදවා ගැනීම. | 60 | 03 | 10 |
| 14 | 1. සැපසේ නින්ද යාම. 2. සැපසේ පිබිදීම. 3, නරක සිහින නොපෙනීම. 4.මනුෂ්‍යයන්ට ප්‍රිය වීම. 5. අමනුෂ්‍යයන්ට ප්‍රිය වීම. 6.දෙවියන් රැකීම.<br>7. විපත්වලින් ආරක්ෂා වීම.<br>8. වහා සිත සමාධි ගතවීම. 9. මුහුණ ප්‍රසන්න වීම. 10. සිහි ඇතිව මරණයට පත්වීම.<br>11. මෙලොවදී රහත් ඵලයට පත් නොවී නම් බඹලොව උපත ලැබීම. | 84 | 03 | 10 |
| 15 | උපසම්පදාව නැවත ආරම්භ කරද්දී පළමුවැන්නා වශයෙන් තමන්ට උපසම්පදාව ලබා ගැනීමට අවස්ථාව තිබියදී මගෙනුත් වැඳුම් ලැබීමට කෙනෙක් සිටිය යුතු යයි පවසා තමන් වහන්සේ පසුව උපසම්පදා වීම.<br>කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් උන්වහන්සේට සංඝරාජ පදවිය පිරිනැමූ පසු 'උඩගු නොව මහණ' යන වැකිය තල්පතක තෙවරක් ලියා තමන් වසන කුටියේ එල්ලා තැබීම. | **78** | **3-4** | 10 |